# පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව
# රත්නපුර දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 27 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 28 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී කල්බදු වාරික ගෙවීම් යටතේ අත්පත් කරගත් පීඩී 7614 අංක දරණ කැබ් රථයේ වත්කමේ වටිනාකම වූ රු. 6,670,000 ක් ප්‍රාග්ධනිත කර තිබූ නමුත්, කල්බදු ණයහිමි ගිණුමට බැර විය යුතු රු. 8,453,563 ක මුදල බැර කර නොතිබූ අතර, එම ණයහිමි ගිණුමට හර විය යුතු මූලික වාරික ගෙවීම් වටිනාකම රු. 2,500,000 ක් සහ කල්බදු වාරික වශයෙන් ගෙවා තිබූ රු. 699,856 ක මුදල හර කර නොතිබුණි.

(ආ) කල්බදු පහසුකම් ලබාගත් දේපලේ වටිනාකමට අදාල සම්පූර්ණ පොලී මුදල ගණනය කර එකී වටිනාකම අවිනිශ්චිත පොලී ගිණුම හර කර ණයහිමි ගිණුම බැර කිරීමෙන් අනතුරුව ගිණුම් වර්ෂයට අදාල පොළී කොටස වූ රු. 443,000 ක් ආදායම් හා වියදම් ගිණුමට හර විය යුතු වුවත් එසේ ගැලපීම් සිදු කර නොතිබුණි.

(ඇ) විවිධ ලෙජර් ගිණුම් හතරකට අදාල ගිණුම් අනුව සමාලෝචිත වර්ෂයේ ලැබීම් හා උපයෝගී ලේඛණ අනුව ලැබීම් අතර රු. 262,544 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු. 32,040 ක පොලිය ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආරම්භක ලෙජර් ගිණුම් ශේෂය රු. 8,039,329 ක් වූ අතර, ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ලැබීම් රු. 12,141,570 කි. ඒ අනුව ණයගැති ශේෂය ඉක්මවා ලැබීම් රු. 4,102,241 ක් සමුච්චිත අරමුදලට බැර කල යුතු වුවත්, එයට පටහැනිව මුද්දර ගාස්තු ණයගැති ගිණුමට බැර කිරීමෙන් වර්ෂ අවසානයේ එම ගිණුමේ ශේෂය එකී වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයේ ගිණුම් විෂයයන් 06 කට අදාලව පාලන ගිණුම අනුව හා උපයෝගී ලේඛනය අනුව රු. 20,262,638 ක වෙනසක් නිරික්ෂණය විය.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම
------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 14,521,996 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ත වියදම ඉක්ම වූ ආදායම රු. 341,861 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 10,420,519 ක් විය.

2.2 බැංකු ගිණුම්
-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට නිකුත් කර මාස 06 ක් ඉක්ම වූ එකතු වටිනාකම රු. 56,539 ක් වූ චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) එකතුව රු. 35,470 ක් වූ අහරු චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189 විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) 2003, 2004 සහ 2007 වලදී ආයතනයට ලැබුණු එකතුව රු. 533,854 ක් වූ චෙක්පත් සහ වෙනත් ප්‍රේෂණ බැංකු ගිණුමට බැර කර නොතිබීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදුකර නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 1993 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා විවිධ ගණක දෝෂ හේතුවෙන් මුදල් පොතේ බැංකු ශේෂය රු. 18,851 ක් අඩුවෙන් දක්වා තිබූ අතර, එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000’ | රු.000’ | රු.000’ |
| (i.) | වරිපනම් හා බදු | 1,761 | 545 | 3,587 |
| (ii.) | බදු කුලී | 1,536 | 1,265 | 365 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 915 | 813 | 3 |
| (iv.) | වෙනත් ආදායම් | 5,253 | 12,503 | - |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i.) | උසාවි දඩ | 10,407,062 |
| (ii.) | මුද්දර ගාස්තු | 697,759 |

2.4 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව ඉකුත් වර්ෂයන්ට අදාලව රු. 673,045ක අධිභාර සම්බන්ධයෙන් කටයුතු කිරීමට යෝජිතව ඇත.

2.5 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේදී රු. 245,000 ක මුදලකට මිලදී ගෙන තිබූ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය 2010 වර්ෂයේදී අක්‍රීය තත්ත්වයට පත්ව තිබූ නමුත් එම යන්ත්‍රය අළුත්වැඩියා කර කුලියට ලබා දීමෙන් සභාවට ආදායමක් ලබා ගැනීමට හෝ අළුත්වැඩියාව සිදුකල නොහැකි නම් වෙන්දේසි කර සභාවට ආදායමක් ලබා ගැනීමට හෝ කටයුතු කිරීමකින් තොරව යන්ත්‍රය අභාවිතව සභා භූමියේ තබා තිබුණි.

(ආ) 2010 වර්ෂයේදී රු. 215,000 ක් වටිනාකමැති ජල බවුසරයක් මිලදී ගෙන තිබූ නමුත්, එමඟින් නියමිත සේවා සැපයීමට නොහැකිව ගාල් කර තිබුණි.

2.6 අවිධිමත් ගනුදෙනු
-------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා සභාපතිවරයාගේ ගමන් වියදම් සහ සංයුක්ත දීමනා වශයෙන් රු. 68,500 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. පළාත් පාලන කොමසාරිස්ගේ 2009 දෙසැම්බර් 22 දිනැති අංක ප.පා.කො/චක්‍රලේඛ/2009/(සංශෝධන) දරන චක්‍රලේඛයට පටහැනිව රාජකාරී සනාථ කිරීම හෝ රැස්වීම් සඳහා කැඳවීම් ලිපි ඉදිරිපත් කර නොතිබුණි. මෙම ගෙවීම් ඍජු ලෙස රාජකාරී කටයුතු සඳහා දරන ලද වියදම් ද යන්න විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 386(6) නියමයන්ට පටහැනිව අවස්ථා 15කදී රු. 465,720 ක් වටිනාකමැති විවෘත චෙක්පත් නිකුත් කර තිබුණි.

2.7 වාහන පාලනය
--------------------

(අ) අංක එල්එෆ් 4824 හා පීඩී 7614 දරන කැබ් රථ දෙකෙහි ධාවන සටහන් වල මයිලෝ මීටරයෙහි සඳහන් කිලෝමීටර් ගණන ඇතුලත් කර නොතිබූ අතර රියදුරන්ගේ ස්ව තක්සේරුව මත ඉන්ධන තුලනය කිරීම සිදු කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගන්නා ලද රු. 776,110 ක් වටිනාකමැති ඉන්ධන ලීටර් 6735 ක භාවිතය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ආ) රු. 273,253 ක වටිනාකම වූ ඉන්ධන ලීටර් 2326 ක් ධාවන සටහන් වලට ඇතුලත් කල බවට සහතික වීමකින් තොරව ගෙවීම් කර තිබුණි.

(ඇ) අංක ඩබ්පී එල්එෆ් 4824 හා පීඩී 7614 යන කැබ් රථ වලට අදාල ධාවන සටහන් වල ඉන්ධන තුලනය කිරීමේදී රු. 8,110 ක වටිනාකමැති ලීටර් 70.35 ක පමණ ඌනතාවයක් පැවති බව විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඈ) පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් අනුව කල්බදු ක්‍රමය යටතේ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් ඩබල් කැබ් රථය මිලදී ගැනීම සිදුකල යුතු වුවත් ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී රු. 6,670,000 ක් වටිනා ඩබල් කැබ් රථයක් පෞද්ගලික ආයතනයක් මඟින් ඍජුව මිලදී ගෙන තිබුණි.

2.8 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) පළාත් මාර්ග යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහන යටතේ වෙන් කරන ලද රු. 954,000 ක ප්‍රතිපාදන යටතේ කෙහෙල් බද්දර ඇල හරහා පැති බැමි පාලම ඉදිකිරීම සඳහා අනුමත සමිතියක් සමඟ ගිවිසුමකට එළඹ 2011 දෙසැම්බර් 29 දින වැඩ අවසන් කර, අවසන් ගෙවීම් වශයෙන් රු. 511,193 ක් ගෙවා තිබුණි. වර්ෂා කාල වලදී ජල මට්ටම පාලමෙන් පිටත මට්ටමට පැමිණීම හේතුවෙන් පාලම වම්පස ඉවුරෙහි පහල කොටසෙහි බැම්ම මතුවන ආකාරයට සම්පූර්ණ ඉවුර සේදී ගොස් තිබු බව 2012 නොවැම්බර් 30 දින කරන ලද භෞතික පරික්ෂාවේදි දක්නා ලදි. තට්ටු පාලමක් වැනි ජලය බැස යාමට පහසු පාලමක් ඉදිකිරීම වෙනුවට විෂ්කම්භය අඩි 3 හියුම් පයිප්ප යොදා ගනිමින් උක්ත ඉදිකිරීම සිදු කිරීම යථෝක්ත ඉවුරු බිදී යාමට ප්‍රධාන හේතුවක් බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මෙම තත්ත්වය පාලමේ යථා පැවැත්මටද අහිතකර ලෙස බලපා තිබුණි. එසේම වැඩ විෂය අංක 09 යටතේ මතුපිට පස් පුරවා තලා මට්ටම් කිරීම සඳහා රු. 24,359 ක් ගෙවා තිබූ නමුත් යථෝක්ත තත්ත්වය මත පාලම මතුපිටට යොදන ලද පස් වලින් කොටසක් සම්පූර්ණයෙන්ම සේදී ගොස් තිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීමට සැලසුම් කර ඇති නීලගම වතුයායේ හෙක්ටයාර් 01ක ඉඩම් කොටසේ ප්‍රාදේශීය සභාවට අයත් හිමිකම පිළිබඳ තහවුරුවක් ලබා ගැනීමකින් තොරව අදාල ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පැවතුණි.

2.9 මෙහෙයුම් අකර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වැය ශීර්ෂ 09 කට අදාලව රු. 75,500 ක් වැය ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ආ) ත්‍රිරෝද ගාල් කිරිම සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා වාර්ෂිකව හෝ මාසිකව සභාවට ආදායමක් ලබා ගැනීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණ ද ත්‍රීරෝද රථ නාම පුවරු සහ ලාංඡන යෙදීම සඳහා රු. 26,500 ක වියදම් දරා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 177(1) රෙගුලාසියට පටහැනිව අවස්ථා 49 කදී එකතු කරන ලද වරිපනම් බදු, වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු රු. 376,776 ක් අදාල එකතු කිරීමේ නිළධාරී විසින් දින 02 සිට දින 27 දක්වා කාල සීමාවක් ප්‍රමාද කර සභාවට ප්‍රේෂණය කර තිබුණි.

(ඇ) සභාවේ සේවය කර මාරු වී ගොස් තිබු නිළධාරින්ගෙන් අයවිය යුතු රු. 312,066 ක ණය මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය